දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2012 පරීක්ෂණය - 2014 දෙසැම්බර්
Bachelor of Arts General (External) Degree Part II 2012 Examination – December 2014

## සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය
## SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය)**

---

01. I. පහත දැක්වෙන ඡේද වත්මන් සිංහලයට නගන්න.
II. ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) හො එ රන්මලාව හිසින් ගෙනැ, "අමා-ඔස්සක් ලදුම්" යි කියමින් ගෙට ගොස් පළමු පුතු මියෙහි ඔතැ. නායක යක්රජ "ස්වාමිහි තමා බෙහෙත් කරන කලැ, අප කිසි දැ නො කට හැක්කැ"යි පලා-ගියෙ. දරු වෙරැ ධූලි පිස්මින් නැඟී, "අන්න, මට මෙ කෙළෙ කිමෙකැ?"යි කී යැ. "තා කළ දැ තො මැ දන්හි? මොබැ එ, තා පරමදක්ෂිණීය කොටැ ගත් බමුණන් ගෙ විප්‍රකාර බල" යි කිව. හෙ බමුණන් ගෙ විප්‍රකාර දැකැ විපිළිසර ඇති වි යැ. එ කල්හි ඔහු මවුඃ "පුතැ, මණ්ඩව්‍යය, තො බාලයෙහි. දානඵල මහත් වන තැන් නො දන්හි. <u>පරමදක්ෂිණාර්හයො</u> නම් මෙසෙ නො වෙති; මාතඞ්ග පණ්ඩිතයා සෙ වෙති. මෙතෙනැ පටන් ගෙනැ මෙ දුශ්ශීලයනට දන් නො දෙ; සිල්වත්නට දෙ. මෙ බල, තා ගෙ කුලුපගයන් අමාඔසු පොවා නීරොග කරම්හ" යි ඉඳුල් කැඳ දිය සැළැ එවැ, අළලා, අසූදහසක් බමුණන් මියෙහි එවුව. බමුණො වෙරැ ධූලි පිස්මින් නැංගහ. එ කල්හි සෙසු බමුණො එ බමුණන්, "සැඬල්හු ඉඳුල් දිය පූහ" යි නොබමුණු කළහ. ඔහු ලජ්ජා ඇති වැ පලා-ගොස් මෙධ්‍ය මහරජහු කෙරෙහි වුසූහ. මණ්ඩව්‍ය කුමර බරණැසැ මැ විසි.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක හිමි. සංස්.)

(ආ) එ වේලෙහි බුදුහු 'මෙ වේලෙහි මොහු ගෙ ජවය ද දර්පය ද සිඳීගියෙ යැ, මෙ විටැ මා මොහු හා බණන්නට සුදුසු කලැ'යි සිතාවදාරා 'ඇපි සිටියම්හ, තො සිටැයි වදාළ හ; එ බස් ඇසූ සොර තෙමෙ "මහණ, තපස්විහු නම් බොරු නොකියන්නාහ. තො යෙමින් සිටැ මා සිටි තෙනැත්තවුට කුමක් පිණිසැ 'අපි සිටියම්හ, තො සිටැ'යි කියයි දැ"යි බිණී යැ එ බස් ඇසූ ස්වාමිදරුවාණො 'මෙ විටැ මා වූ නියාව හඳුන්වා බණ කියමී' සිතා මතැතක්හු පෙරැළී සිටිනා සෙ පෙරැළී සිටැ 'බණ කියමී' සිතූ සිත හා එක් වැ මැ නොයෙක් වණියෙන් යුක්ත වූ සිතියමින් ගැවැසීගත් පෙත්තක් විදහාලන්නා සෙ සර්වාඞ්ගයෙහි සඟවාගෙනැ වැඩි දෙ තිස් මහා පුරුෂ

ලක්ෂණ <u>අශීත්‍යනුව්‍යඤ්ජන-කේතුමාලා-ව්‍යාමප්‍රභා</u> එක පැහැර සඳැස් පිල් විදහන් ස්වර්ණමයූර රාජයා සෙ එක පැහැර විදහා බුදු රුව දක්වා ඔහු ඇස් නිවා, දල්වූ ශ්‍රී මුඛයෙන් නික්මුණු සුගන්ධයෙන් සියලු වන ලැහැබ එක සඳුන් කරඬුවක් සෙ එක කපුරු විතක් සෙ සුවඳ කෙරෙමින් වන දෙවතාවන් කරන සාධුකාරයෙන් සියලු වනය එකකොලාහල කෙරෙමින් බණට පටන්-ගත් හ.

(බුත්සරණ, ලබුගම ලංකානන්ද හිමි. සංස්.)

(ඇ) වැදිතෙමේ පස්පනස් හවුරුද්දක් මුළුල්ලෙහි දල්පැන් ආදිය ඇති කොටගෙන හුරන් මරා කා විකොට ජීවත් වෙයි. සාය අවධියෙහි දී හූරු වෙළඳාම් හැඟෙන නියාව දන වී සාල් හැරගෙන පිටිසරට ගොසින් නැළිය දෙනැළිය දීලා ගම්හුරුපැටවුන් හැරගෙන වී ගෙනගිය ගැල පුරා ගෙනවුත් ගෙපිටිපස්සෙහි හුරුගාලක් ගසාලා ගාල ඇතුළත ම උන්ගේ අනුභවයට නිස්සත් ඇතිකොට ඒ හැම කා වැඩුණු අවස්ථාවෙහි තෙමේත් පචි කොට වැඩුණේ යම් යම් හූරකු මරා කනු කැමැත්තේ වී නම් ඒ හූරා තර කණුවෙක නොසැලෙනා ලෙස බැඳ සිටුවාලා මස් බොල් වනු නිසාත් පචි බොල් වනු නිසාත් සිවුරැස් මුඟුරකින් කළා මස් <u>බොල් වූ නියාව මුත් පචි බොල් වූ නියාව නොදන</u> තමාගේ චිත්තශුද්ධියක් නැතත් ඌගේ ශරීරශුද්ධිය නිසාත් ඌගේ පුරාකෘත අකුශලකර්මයෙන් භාගයක් වුවත් සෝධන්ට අවීචියෙහිදී තමාගේ කටත් දල්වන ලෙසට ඌගේ කටත් දල්වා කට නොපියන ලෙසට දඬුකඩක් ගන්වාලා ලෝසාළුවෙන් තමා කට ලෝදිය වත් කරන ලෙසට ඌගේ කටත් යසැන්දකින් තර ව කකියාගිය හුණු පැන් වත්කෙරෙයි. ඒ වත්කළ හුණු පැන් කුස ඇතුළට වැද කකියමින් කසළත් හැරගෙන අධොභාගයෙන් නික්මෙයි. එසේ නික්මෙන පැන් යම්තාක් මඳකුත් කසළෙක් බඩ ඇතුළේ ඇත් නම් කැළඹී එයි. එහි කසළ නැත්නම් ප්‍රසන්න ව බාහ්‍ය වෙයි.

(සද්ධර්ම රත්නාවලිය, ප්‍රාචීන භාෂෝපකාර සමිතිය. සංස්.)

(ඈ) එබස් අසා කුස රජ්ජුරුවෝ චාටු මනෝඥ වූ අංගප්‍රත්‍යංගාදී ස්ත්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වූ ප්‍රභාවතීන් අනෙක කෝටි හා නාටක ස්ත්‍රීන් ව අනන්ත <u>සාමන්තචක්‍ර මෞලිමාලලාලිත</u> පාද පීඨ ඇති රාජ්‍යශ්‍රී ද හැර පෙර තොප කෙරෙහි බැඳුනු සිතින් නොරටට පැමිණ දුක් විඳිමින් තොප හා සමඟ ප්‍රේමාන්විත වූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දා වූ මම භාවභාව ලීලාකටාක්ෂ නිරීක්ෂණ මන්දස්මිත මධු මධුර භාෂිතාදි සෞභාග්‍යයෙන් යුක්ත කොමලාංග ඇති තොපගේ ළය ගලකින් කරනලදැයි සිතමි. තව ද ප්‍රභාවතිනි තෙපි යම් පමණ කලක් කෝපයෙන් බැම බිඳ රුෂ්ටව බලන්නී ද ඒතාක් මද්‍ර රජ්ජුරුවන්ගෙ මේ භවනයෙහි දුක් විඳිමින් අරක්කැමි ව වාසය කෙරෙමි. යම් කලෙක්හි සිනා පහළ කර ස්නිග්ධ වූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහි ද එකල චිත්ත සන්තාපයන්. දුරුකොට රාජ්‍යශ්‍රීයට පැමිණියාක් මෙන් වෙමි. එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳු වූ තද මන් නොකරව" යනාදීන් යාඥා කීවාහුය.

(පන්සිය පණස් ජාතක පොත, ජාතික පුස්තකාල සේවා මණ්ඩල. සංස්.)

(ලකුණු 28 යි)

02. කුරුණෑගල අවධියෙහි සිංහල ගද්‍ය සාහිත්‍යයේ විද්‍යමාන සුවිශේෂ ලක්‍ෂණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

03. අමාවතුර පරිවර්තන ග්‍රන්ථයක් වශයෙන් සැලකීමේ දී ඒ තුළ ඔබ දක්නා විශේෂ ලක්‍ෂණ සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

04. "බුත්සරණෙහි විද්‍යමාන වන්නේ භාව ප්‍රකාශන ශක්තියෙන් අනූන රචනා විලාසයකි." සනිදර්ශන ව සනාථ කරන්න.

05. ශ්‍රාවක හදවත් ආකර්ෂණය කර ගැනීමෙහි ලා ධර්මසේන හිමියන් විසින් භාවිත විවිධ රචනෝපක්‍රම කවරේ ද යි නිර්දේශිත කථා වස්තු ඇසුරින් විමසන්න.

06. ජාතක කථාවල සම්භවය හා විකාශය සංක්‍ෂිප්ත ව දක්වා ඒවායෙහි ආකෘතික ලක්‍ෂණ විභාග කරන්න.

(02 - 06 ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛